# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2253/10 - 2021 නොවැම්බර් මස 09 වැනි අඟහරුවාදා - 2021.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 40/1973 (I)

**(222 වන අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනත**

(222 වන අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ 2 වන සහ 3 වන වගන්ති යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල,
සෞඛ්‍ය අමාත්‍ය.

2021 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

කලින් කල සංශෝධිත 1925 අගෝස්තු මස 28 වැනි දින අංක 7481 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ධාන්‍ය ගබඩා කිරීම සම්බන්ධයෙන් වන නියෝග හා ඇන්චිලොස්ටොමියාසිස් සම්බන්ධයෙන් වන නියෝග පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 1 වන නියෝගයට ඉක්තිබිව ම, පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :-

"1අ. සමස්ත ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් නිසි බලධරයා වන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබූ, දෙනු ලැබූ හෝ නිශ්චිතව දක්වනු ලැබූ මාර්ගෝපදේශ, චක්‍රලේඛ, විධාන, උපදෙස් හෝ නියම සහ කොන්දේසි 1 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති වෙනත් නිසි බලධරයන් විසින් නිකුත් කරනු ලැබූ, දෙනු ලැබූ හෝ නිශ්චිතව දක්වනු ලැබූ මාර්ගෝපදේශ, චක්‍රලේඛ, විධාන, උපදෙස් හෝ නියම සහ කොන්දේසි අභිභවනය කරනු ලැබිය යුතු අතර, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ එම මාර්ගෝපදේශ, චක්‍රලේඛ, විධාන, උපදෙස් හෝ නියම සහ කොන්දේසි ක්‍රියාත්මක කිරීම වෙනත් යම් නිසි බලධරයන්ගේ කාර්යය විය යුතු ය." ;


1A - PG 5610 — 510 (2021/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) එහි 98 වන නියෝගයට ඉක්තිබිව ම, පහත දැක්වෙන අලුත් නියෝගය එකතු කිරීමෙන් :-

"99. (1) සමස්ත ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන නිසි බලධරයා විසින්, එකී නිසි බලධරයා විසින් නිශ්චය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා, 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) සම්බන්ධයෙන් වන රෝගී ප්‍රදේශයක් ඇතුළත හෝ ඉන් පිටත වන ඒකරාශීවීමක්, ක්‍රියාකාරකමක් හෝ අවස්ථාවක් සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි ය-

(අ) ඒකරාශීවීම, ක්‍රියාකාරකම, අවස්ථාව හෝ ඒ හා සමාන රැස්වීම පැවැත්වෙන ස්ථානය සහ එහි වටපිටාව. ව්‍යුහය හෝ වටමායිම ; සහ

(ආ) එම ඒකරාශීවීම. ක්‍රියාකාරකම, අවස්ථාව හෝ ඒ හා සමාන රැස්වීම පැවැත්වෙන ස්ථානයකට සහභාගීවීමට අවසර ලබාදෙන උපරිම තැනැත්තන් සංඛ්‍යාව හෝ අවසර ලබා දිය හැකි ධාරිතාව හෝ සමස්ථ ධාරිතාවේ ප්‍රතිශතය.

(2) යම් තැනැත්තකු විසින්, (1) වන අනුනියෝගය උල්ලංඝනය කරමින් යම් ඒකාරශීවීමක්, ක්‍රියාකාරකමක්, අවස්ථාවක් හෝ ඒ හා සමාන රැස්වීමක් සඳහා අවසර ලබා දීම හෝ ඊට සහභාගි වීම නොකළ යුතු ය.

(3) (1) වන අනුනියෝගය යටතේ නිකුත් කරනු ලැබූ සෑම විධානයක්ම, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය."

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.